# පරිසර අමාත්‍යාංශය
# சுற்றாடல் அமைச்சு
# Ministry of Environment

"සම්පත්පාය" අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சம்பத்பாய" இல. 82, ராஜமல்வத்த வீதி, பத்தரமுல்லை, இலங்கை.
"Sampathpaya" No. 82, Rajamalwatta Road, Battaramulla, Sri Lanka.
Gen. Tel: +94 - 11 - 2882112 - 3

ලේකම් / செயலாளர் / Secretary +94-11-2877290

ෆැක්ස් / பெக்ஸ் / Fax +94-11-2877292


මගේ අංකය / எனது இல. / My No. 2/6/1/DS-2012 GE

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2012.09. 12

පරිසර චක්‍රලේඛ අංක: 02/2012

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

<u>"දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩසටහන - 2012 නොවැම්බර් මස 15</u>

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජන්ම දිනය සහ දෙවන පදවි ප්‍රාප්තිය සැමරීම කේන්ද්‍ර කර ගනිමින් 2010 වසරේ ආරම්භ කරන ලද "දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩසටහන වාර්ෂිකව ක්‍රියාත්මක කලයුතු බවට 2011.09.14 දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත. ඒ අනුව එම වැඩසටහන රාජ්‍ය අංශයේ පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල සහභාගිත්වයෙන් මෙම වසරේත් නොවැම්බර් මස 15 දින පැවැත්වීමට සියළු කටයුතු සූදානම් කොට ඇත.

02. "දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩසටහන මගින් ඉටු කරගැනීමට අපේක්ෂිත අරමුණු අතර භූගත ජලමට්ටම වැඩිකරගැනීම එමගින් කෘෂිකර්මාන්තයට අවශ්‍ය කෙරෙන ජලසම්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කරගැනීම, පස සෝදායාම වලකා පස සංරක්ෂණය කර ගැනීම, ජාතික විදුලිබල පද්ධතියට ජලවිදුලියෙන් ලැබෙන දායකත්වය වැඩිකරගැනීම, දැව අවශ්‍යතා සපුරා ගැනීම, පසේ සරු බව ඉහල නංවාලීම, වායුගෝලයේ ගුණාත්මක බව වැඩි දියුණු කරගැනීම ආදිය ප්‍රධාන වශයෙන් හඳුන්වා දිය හැක.

03. එමෙන්ම ශ්‍රී ලංකාවේ ජෛව සම්පත් සහ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා ද දේශගුණ විපර්යාස, භූමි හායනය හා නියඟය වැනි ගෝලීය පාරිසරික ගැටළු නිරාකරණය කිරීම සඳහාද මෙම වැඩසටහන මගින් ලැබෙන දායකත්වය අතිමහත්ය . ඒ අනුව දැයට සෙවණ ජාතික රුක් රෝපණ වැඩසටහන තුලින් මහින්ද චින්තන ඉදිරි දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුවේ සඳහන් නිල්ල පිරුණු රටක් උදාකරගැනීමටද අවස්ථාව සැලසෙනු ඇත.

04. මෙම වසරේ "දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩ සටහන යටතේ රුක් රෝපණය කිරීම සඳහා කාර්යාල පරිශ්‍ර, පොදු ස්ථාන, මහා මාර්ග දෙපස, වැව් තාවුළු, හායනයට ලක්වුණු ඉඩම්, ඇළ දොළ ගංගා දෙපස බෑවුම් සහිත ඉඩම් මෙන්ම වන වගා රහිත පැල සිටුවීමට සුදුසු අනෙකුත් සියළුම භූමි යොදා ගැනීම යෝග්‍ය වේ. ඊට අතිරේකව ඉහත වැඩසටහනට සමගාමීව පරිසර සංරක්ෂණය කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු පාංශු සංරක්ෂණ ව්‍යාපෘතීන් හා පරිසර සංරක්ෂණයට අදාල විවිධ කර්තව්‍යයන් පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් සංවිධානය කිරීමද අපේක්ෂා කෙරේ.

05. පරිසර සංවර්ධනය පිලිබඳ අනාගත පරපුරේ ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් සමස්ත පාසල් ශිෂ්‍ය ප්‍රජාවගේ ක්‍රියාකාරී දායකත්වය මෙම වැඩසටහන සඳහා ලබාගැනීමටද කටයුතු කෙරෙනු ඇත.

06. ඒ අනුව 02 වන ඡේදයේ විස්තර කරන ලද අරමුණු ඉටුකර ගැනීම පිණිස 04 ඡේදයෙ හි සඳහන් වැඩසටහන් ඔබගේ ආයතන/බල ප්‍රදේශ තුල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් නිකුත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි. එමෙන්ම ඔබ ආයතනය විසින් මෙම වසරේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද වැඩසටහන් සමග ඒකාබද්ධ කර ගනිමින් එලඹෙන නොවැම්බර් මස 15 දිනට අදාල ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් සිදු කරන මෙන් වැඩි දුරටත් ඉල්ලා සිටිමි. කෙසේ වෙතත් රුක් රෝපණ වැඩසටහන් සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ලබාදිය හැකි පැල ප්‍රමාණය සීමාසහිත බැවින් හැකි තරම් ක්ෂේත්‍රයෙන් පැල ලබාගන්නා ලෙසත්, පැල සිටුවීම සෑම පුරවැසියෙකුගේම වගකීමක් බැවින් මේ සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන ලෙසට උපදෙස් දීම සුදුසු බවත් සඳහන් කරමි.

07. "දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩසටහන තිරසර සංවර්ධනයට අතිශය වැදගත් වන බැවින් ඒ යටතේ සිදුවන සෑම පැළයක්ම රැක බලා ගැනීම, නඩත්තු කිරිම හා වාර්තා පවත්වා ගැනීම අවශ්‍ය වේ. එමගින් 2 වන ඡේදයහි විස්තර කරන ලද අරමුණු ඉටු කර ගැනීම සඳහා වැඩසටහනින් ලැබෙන දායකත්වය කාලානුරූපව තක්සේරු කලහැකි වනු ඇත. ඒ අනුව, මෙම කාර්යයට සම්බන්ධ වන ආයතනයන් විසින් තම තමන්ගේ වැඩසටහන තුළම ඇතුලත් කර ගන්නා කාල රාමු ඔස්සේ පසු විපරම් ක්‍රියාවලියක් සිදු කිරීම උචිත යයිද යෝජනා කරමි.

08. "දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩසටහන ජාතික මට්ටමින් සම්බන්ධීකරණය කිරීම සඳහා මෙම අමාත්‍යාංශය යටතේ දැයට සෙවණ කාර්යාලය නමින් වෙනම ඒකකයක් ස්ථාපිත කොට ඇති අතර එහි දුරකථන අංක පහත දැක්වේ.

දුරකථන අංක :+94 - 11- 2878806/2877287/2868072/2877290
ෆැක්ස් අංක : +94 – 11 – 2877292/2868072
විද්‍යුත් තැපැල (ඊ මේල්) : dayatasevana@gmail.com/sugath2@gmail.com

ඊට අමතරව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය කෙරන සහාය සහ උපදේශන සේවා අමාත්‍යාංශයේ විවිධ අංශවලින් හා ආයතනවලින් සැපයෙනු ඇත.

12. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟත්වය ඇතිවය.

**බී.එම්.යූ.ඩී. බස්නායක**
ලේකම්
පරිසර අමාත්‍යාංශය

**පිටපත්** - 1 . ජනාධිපති ලේකම් - දැ.පි.
2 . අග්‍රාමාත්‍ය ලේකම් - දැ.පි.
3. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම පිණිස
4. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය - අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම පිණිස
5. වන සංරක්ෂක ජනරාල්
6. සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය
7. සභාපති, රාජ්‍ය දැව සංස්ථාව
8. සභාපති, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය
9. සභාපති, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
10. සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
11. සභාපති, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

(5 – 11) අවශ්‍ය සහාය ලබාදෙනු පිණිස